මව්බිම දෙකට කැඩුනත් කමක් නැහැ ඔය කැල්ල උන්ට දීලාහරි කමක් නැහැ මේ කාලකන්නි යුද්ධය ඉවරවෙනවනම් මොකද මේක කෙළවරක් නැති යුද්ධයක්.මේකේ ඉවරයක් නෑ මෙකෙන් වෙන්නේ මේ රටේ තරුණ කොල්ලොටික නැතිවෙන එක විතරයි. බලන්න අරපැත්තෙයි මෙපැත්තෙයි කොයිපැත්තේ මැරුනත් මැරෙන්නේ මේරටේ කොල්ලො.දැන් කොච්චර කල්ද? ඒත් මේකෙ ඉවරයක් තියෙනවද?
අනික මේක මුඩු පොළවක්, වැළිකඳු විතරයි තියෙන්නේ මේකටයි අපි මරාගන්නේ. එහේ මිනිස්සු මේ පොළවත් එක්ක ඔට්ටු වෙනව අපි හොඳට දැකල තියෙනව. අපිට ඒ හයිය නැහැ ඒත් අපි කෙළවරක් නැති යුද්දෙක පැටලැවිලා.
මෙ පසුගිය සතියෙ දවසක මමත් මාගේ කාර්යාලයේ මිතුරන් දෙදෙනෙකුත් රාජකාරී කටයුත්තකට ගොස් එන ගමනේදී පුත්තලම කලපුව අසලදී හමුවු තරුණයන් දෙදෙනෙකු අප සමග කථාකරමින් සිටියදී කියාසිටි කථාවයි.

අප පුත්තලම කලපුව අසලට ගියේ මධුවිත ටිකක් පානය කිරිමේ අරමුණෙනි එහෙත් පුත්තලමේ වයින් ස්ටෝර්ස් එකක් තියෙන තැනක් අප දැනගෙන නොසිටි නිසා ඒ අසල සිමෙන්ති බංකුවක වාඩිවී සිටි තරුණයන් දෙදෙනෙකු ගෙන් ඒ පිළිබඳ විමසුවෙමු. එවිට ඔවුන් දෙදෙනා අපට වයින් ස්ටෝර්ස් එකක් තියෙනතැන පෙන්වීමට එකඟ වුනි. නමුත් ඔවුන් කීවේ වයින් ස්ටෝර්ස් එක ළඟ තියෙන්නේ වාහනයෙන් එනවානම් ගිහින් පෙන්වන්නම් කියායි. අවශ්‍ය කාරිය කරගෙන නැවත කලපුව ලඟට අපි ආපසු වාහනෙන් බැස්ස තරුණයන් දෙදෙනා පැවසූවේ. අපිත් කොල්ලො තවත් කොල්ලෙක්ට උදව් කරන එක යුතුකමක් නමුත් වාහනෙන් යන්න අඬගහපු එක ගැන සමාවෙන්න. මේක අපිට දුරක් නෙමේ හැතැප්ම 15 20 පයින් ගියවුන් අපි වාහනෙන් යමුකිවුවට තරහ වෙන්න එපා. අපි දෙන්නාම ආමි එකේ අපි දෙන්නාගේම වම් කකුල නැහැ මේ තියෙන්නේ බොරු කකුල්, ඒකයි වාහනෙන් යමු කිවුවෙ.

පසුව මගේ ආරාධනාවෙන් ඔවුන් දෙදෙනාද අප සමග මධුපානයට සෙට් වුනි.ඉන් පසු ඇතිවු කථාබහේදී තවත් බොහෝ දේ ඔවුන් දෙදෙනා විසින් කථාකළා. වෙනදට බොනකොට සමාජ දේශපාලනික බොහෝදේ කථාකරන අපි එදා ඔවුන් දෙදෙනාට ඉඩදී නිහඬව සවන් දුනෙමු.

මෙ ප්‍රශ්නෙ ඇති වෙන්න හේතු ගොඩක් තියෙනවා බලන්න යාපනේ මිනිස්සු එහේම නැත්තම් අපේ රටේ අනෙක් දුරබැහැර පැතිවල මිනිස්සු තමන්ගේ දෙයක් කරගන්න කොළඹට එන්න ඕනි ඒ මිනිස්සුන්ගෙ දේවල් ඒ මිනිස්සු ඉන්න පැතිවලදීම කරගන්න ඉඩදෙන්නේ නැත්තේ ඇයි? ඒ මිනිස්සුන් ගේ දේවල් ඒ පළාත් වලම කරගන්න කියලා මේ කොළඹ තියෙන ඔෆස් ඒ පලාත් වලට ගෙනියන්න ඕනි. අනික අපි පිළිගන්න ඕන ඒ මිනිස්සුන්ට අපෙන් වෙච්ච අසාධාරණ කම් මේවා තමයි මේ ප්‍රශ්න මේ තරම් උග්‍ර වෙන්න හේතු උනේ. කොළඹ වගේම බිල්ඩින් යාපනයෙත් හදන්න ඕනි මෙහේ තියෙන දේවල් එහේ ගෙනිහින් ඒ අයගෙ දේවල් ඒ අයට කරගන්න ඉඩ දෙන්න ඕනි. ඔය කියන බලය බෙදීම හරි මොකක් හරි දීලා මේ යුද්දේ ඉවරකරන විදිහක් කල්පනා කරන්න ඕන. මේක ඉවර කරන්න බැරි යුද්ධයක්.

මෙ අප රටේ යුද්ධයට සිය පාද අහිමි කරගත් තරුණ සොල්දාදුවන් දෙදෙනෙකුගේ යුද්ධය පිළිබඳ දැක්මයි. මේ තරුණ සොල්දාදුවන් වෛයිරය වෙනුවට තෝරාගෙන ඇත්තේ සාමයයි. ඒත් මේ දේ අප රටේ බහුතරයකට නොතේරීම අද අපවිසින් විඳින්නාවු ඛේදවාචකය නොවන්නේද?